මොරවැව ප්‍රාදේශීය සභාව

ත්‍රිකුණාමලදිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

-------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 ජුනි 07 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 27දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 27 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මොරවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉදිකිරීම් කොන්ත්‍රාත් 07 ක් වෙනුවෙන් ජනාධිපති අරමුදලින් ලැබිය යුතු රු.8,444,805 ක් හා එම කොන්ත්‍රාත් වෙනුවෙන් ගෙවිය යුතු රු.8,444,805 ක් ගිණුම්වලින් මඟහැරී තිබුණි. තවද එම වටිනාකම ප්‍රාග්ධන ආදායම් හා ප්‍රාග්ධන වියදම් වලින් මඟහැරී තිබුණි. | ගිණුම්වලට ගැළපිය යුතුවේ. | 2020 අවසන් ගිණුම් සැකසීමේදී ගැළපීමට කටයුතු කරමි. |
| (ii) | 2018 වර්ෂයට අදාළව ලැබුණු රු.78,110ක මුද්දර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් සැකසීමේදී කාලසීමාවට අදාළ සියලුම ආදායම් වියදම් ගැළපිය යුතුවේ. | 2020 අවසන් ගිණුම් සැකසීමේදී ගැළපීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ කඩකුලී ආදායම් රු.247,795 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම්වලට ගැළපිය යුතුවේ. | පෙර වර්ෂය වෙනුවෙන් අයවිය යුතු කුලී 2019 වර්ෂයේ කුලී ලෙස සටහන් කර ඇති බැවින් 2020 අවසන් ගිණුම් සැකසීමේදී නිවැරදි කරමි. |
| (iv) | ජල නල හානි වීම වෙනුවෙන් ලද හානි පූර්ණ මුදල්රු.160,714 ක් තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | ගිණුම්වලට ගැළපිය යුතුවේ. | 2020 අවසන් ගිණුම් සැකසීමේදී ගැළපීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (vi) | කඩකාමර කුලී මුදලට හිලව් කළ තැන්පතු මුදල් රු.147,861 ක් ආදායමට බැර කර නොතිබුණි. | ආදායමට ගත යුතුවේ. | ගිණුම්ගත කිරීමේදී අතපසු වී ඇත. 2020 අවසන් ගිණුම් සැකසීමේදී ගැළපීමට කටයුතු කරමි. |
| (vii) | ස්ථාවර වත්කම් යටතේ දැක්විය නොහැකි රු.607,500 ක් වටිනා අයිතම 17 ක් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම්වලට ගැළපිය යුතුවේ. | 2020 අවසන් ගිණුම් සැකසීමේදී ගැළපීමට කටයුතු කරමි. |
| (vii) | දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොළිය හා ණය වාරික මුදලේ එකතුව ණය ප්‍රාග්ධනය යටතේ දක්වා තිබියදී රු.362,854 ක ගෙවිය යුතු ණය පොළිය ජංගම වගකීම් යටතේ නැවත වරක් දක්වා තිබුණි. | ගිණුම්වලට ගැළපිය යුතුවේ. | තවදුරටත් සොයා බලා දෙවරක් ගිණුම්ගත කර ඇත්නම් 2020 අවසන් ගිණුම් සැකසීමේදී ගැළපීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳීම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ තැන්පතු ශේෂය ලෙජරය අනුව රු.694,894 ක් වුවද ශේෂ පත්‍රය අනුව රු.1,286,344 ක් වූයෙන් රු.591,450 ක නොසැසඳීමක් විය. | නිවැරදි තැන්පතු ශේෂය ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතුවේ. | නැවත නිවැරදිව පරීක්ෂා කොට වැඩිපුර සඳහන්ව ඇති තැන්පතු ප්‍රමාණය ඉවත් කිරීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2011 වර්ෂයේ සිට පැවත එන රු.7,864,759 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | අවිනිශ්චිත ගිණුම් බැර ශේෂය කුමක්දැයි නිවැරදිව හඳුනාගත නොහැක. ඉදිරියේදී නිරවුල් කිරීමට උත්සාහ කරමි. |

(ඇ) විගණනයසඳහාසාක්ෂිනොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකිරීම නිසා රු.94,035,781 ක් වූ වත්කම් ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ලේඛන සකස් කොට නිසි පරිදි වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය. කාලවිශ්ලේෂණ සකසා ඉදිරිපත් කළ යුතුවේ. | වත්කම් උපලේඛනගත කිරීම ආරම්භ කර ඇත. ඉදිරියේදී නිවැරදි ලේඛන නඩත්තු කළ හැකිය. |

(ඉ) ලැබිය යුතු ගිණුම් ශේෂ

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | (i) | ආදායම් ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.950,536 ක මුදලක් නිරවුල් කර ගැනීමකින් තොරව වසර 10 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුවේ. | ආදායම් ණයගැති ශේෂය කුමක්දැයි නිවැරදිව හඳුනාගත නොහැකිය. ඉදිරියේදී නිරවුල් කිරීමට උත්සාහ කරමි. |
| | (ii) | අත්තිකාරම් ලෙස ලබා දී තිබූ රු.1,826,485 ක ශේෂයක් නිරවුල් කර ගැනීමකින් තොරව 2017 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | නිරවුල් කරගැනීමටකටයුතු කළ යුතුවේ. | නිවැරදිව හඳුනාගත නොහැකිය. ඉදිරියේදී නිරවුල් කිරීමට උත්සාහ කරමි. |

1.4 අනුකූල නොවීම

නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| | (i) 24 වගන්තිය | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉන්වෙන්ට්‍රිය සකස් කරමින් පවතී. මේ වසර අවසානයේ දී ගැසට් කිරීමට කටයුතු යොදා ඇත. |
| | (ii) 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.2,771,241 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කොටසක් අයකරගෙන ඇති අතර සම්පූර්ණ මුදලම අයකර ගැනීමට පියවර ගෙන ඇත. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) 217 වැනි රීතිය | ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන අතර එය යාවත්කාලීන කර නොමැත. ඉදිරියේදී |

| | | | |
|---|---|---|---|
| | | | එය නිවැරදි කරමි. |
| (ii) 218 වැනි රීතිය | සියලුම ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කළ යුතුවේ. | සමීක්ෂණයක් කිරීමට කටයුතු යොදා ඇත. ඉදිරි වර්ෂවල සිට නිවැරදිව කටයුතු කරමි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>---------------------------- | | | |
| (i) මුදල් රෙගුලාසි 571 | වසර 2 ක් ඉක්මවූ රු.1,079,630 ක තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එම තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීමට මේ වන විට පියවර ගෙන ඇත. 2020 වසර අවසන් වීමට පෙර නිවැරදි කරමි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 (ආ) සහ 1646 | වාහන 05 ක ධාවන සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිලධාරීන්ගේ අතපසුවීමක් නිසා එසේ සිදුවී ඇත. ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 686,205 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 324,795 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

-------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම්හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2018 | | | | 2019 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| කුලී | 5,360 | 2,408 | 2,183 | 225 | 1,330 | 1,105 | 1,064 | 129 |
| බලපත්‍ර ගාස්තු | 50 | 166 | 166 | - | 300 | 171 | 169 | 18 |
| වෙනත් ආදායම් | 3,571 | 3,569 | 3,569 | - | 5,300 | 4,667 | 2,445 | 2,508 |
| එකතුව | 8,981 | 6,143 | 5,918 | 225 | 6,930 | 5,943 | 3,678 | 2,655 |

### 2.2.2 කඩකාමර කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට කඩකාමර කුලී රු.129,928 ක් හිඟව පැවති අතර ඉන් රු.112,466 ක් ඉකුත් වර්ෂයට අදාළ විය. | හිඟ ආදායම අප්‍රමාදව අයකර ගත යුතුවේ. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 වාහන ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට වාහන කුලී ආදායම් රු.567,680 ක් අයකර ගැනීමට පැවතුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු යොදා ඇත. කොටසක් මේ වන විට අයකර ගෙන ඇත. |

### 2.2.4 උසාවි දඩ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ උසාවි දඩ රු.2,055,133 ක් අයකර ගැනීමට පැවතුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු යොදා ඇත. කොටසක් මේ වන විට අයකර ගෙන ඇත. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුවේ. | අතුරු ව්‍යවස්ථා 06 ක් අනුමත කර යවා ඇත. අවසන් අනුමැතිය මෙතෙක් ලැබී නොමැත. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට සකස් කර ඇත. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්නායක සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. | සභාවේ පවතින ආර්ථික තත්ත්වය නිසාවෙන් තිරසර සංවර්ධන ඉලක්ක හා නිර්ණායක පිළිබඳ කිසිදු වැඩසටහනක් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සභාව සතුව නොමැත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 05 කට වැඩි කාලයක සිට තනතුරු 07 ක නිලධාරීන් 08 කගේ ඌණතාවයක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | කිහිපවරක් ඉල්ලීම් කර ඇතත් මේ දක්වා පුරප්පාඩු සම්පූර්ණකිරීමට කටයුතු නොකිරීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. |

3.2.2 සේවක ණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය හැරගිය සේවකයන් සිව්දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 100,145 ක් විය. | අයවීමට ඇති ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම සේවකයන් 04 දෙනා මේවන විට පදිංචි ස්ථානයක් නිවැරදිව හඳුනාගත නොහැකි වී ඇත. එම නිසා මෙම මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇත. ඉදිරියේදී නිසි අනුමැතියක් ලබාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.510,000 ක් වටිනාබඳුන් 57 න් 24 ක් 2020 ජූලි 30 වන විටත් අදාළ අරමුණට යොදා නොගෙන නිශ්කාර්යව තිබුණි. | අවශ්‍යතා හඳුනාගෙන අප්‍රමාදව කසල බඳුන් බෙදා හැරිය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම්වල සභාව විසින් 2019 දෙසැම්බර් 31 වන විට රු.55,520,622 ක වටිනාකමකින් යුත් ගොඩනැගිලි, ක්‍රීඩාංගන, පොදු ළිං, ප්‍රජා ශාලා, ජල ටැංකිහා පොදු වෙළඳපලවල් ආදිය | ඉඩම්වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාළ ඉඩම් සභාව වෙත පවරා ගැනීමට මේ වන විට කටයුතු කරමින් සිටී. |

ඉදිකර තිබූ නමුත් මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි.

3.4.2 ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වසර 06 ක සිට භාවිතයෙන් ඉවත් කළ කැබ් රථය බැහැර කිරීමට හෝ පිළිසකර කර භාවිතයට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | බැහැර කිරීමට හෝ අළුත්වැඩියා කර භාවිතයට ගත යුතුවේ. | මෙම වාහනයේ අයිතිකරු නිවැරදිව හඳුනාගත නොහැක. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය වෙත භාරදීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | සභාව සතු වාහන 02 ක් අළුත්වැඩියා කිරීමකින් තොරව නිශ්කාර්යව පැවැතුණි. | අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාහන 02 අළුත්වැඩියා කිරීම ආරම්භ කර ඇත. මූල්‍ය අපහසුතා නිසා අළුත්වැඩියා කටයුතු ප්‍රමාද විය. |

3.5 ප්‍රසම්පාදනය

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | නිලධාරීන්ගේ දැනුම නොමැති නිසා සකස් කර නැත. 2020 වර්ෂය සඳහා සකස් කර ඇත. |

3.6 වාහන පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන 04 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ආදායම් බලපත්‍ර අදාළ වර්ෂවලදී ලබා ගත යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | ධාවන මට්ටමේ පැවති මෝටර් වාහන 03 ක් සඳහා රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. | රක්ෂණ ආවරණයක් අදාළ වර්ෂවලදී ලබා ගත යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී රක්ෂණ ආවරණ ලබා ගැනීමට කටයුතු කරමි. |

3.7 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ප්‍රකාරව සමිතිවලට ලබාදෙනු ලබන කොන්ත්‍රාත් සමිති බලප්‍රදේශ තුළ වියයුතු වුවද කොන්ත්‍රාත් 04 ක් සමිති බල ප්‍රදේශයෙන් පිට සමිති වෙත පිරිනමා තිබුණි. | සමිති බල ප්‍රදේශයෙන් පිටත සමිති වෙත ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබා නොදිය යුතුවේ. | සමිතිවල කාර්යක්ෂමතාවය හා ක්‍රියාකාරිත්වය සලකා එසේ කොන්ත්‍රාත්තු ලබාදුනි. ඉදිරියේදී එසේ නොකිරීමට කටයුතු කරමි. |
| (ආ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ මුදල් රෙගුලාසි අංක 1/2012 දරන 2012 ජනවාරි 05 දිනැති චක්‍රලේඛයේ 3.1 ප්‍රකාරව මූල්‍ය හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව රු.99,474 සිට 488,458 ක ඉතිරිකිරීමේ බැංකු ශේෂයක් සහිත සමිතිවලට රු.මිලියනය ඉක්මවූ කොන්ත්‍රාත් ලබාදී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය හැකියාව පරීක්ෂා කර බලා කොන්ත්‍රාත් පිරිනැමිය යුතුවේ. | කාර්යක්ෂමතාවය හා ක්‍රියාකාරිත්වය සලකා එම කොන්ත්‍රාත්තු ලබාදුනි. ඉදිරියේදී නිසි පරිදි මූල්‍ය තත්ත්වය පරීක්ෂා කොට කොන්ත්‍රාත්තු ලබාදීමට කටයුතු කරමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනය ඒකකය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇත. ක්‍රියාත්මක මට්ටමේ නොමැත. ඉදිරියේදී නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වේ. | 2019 වර්ෂයේදී තුන්වරක් රැස්වී ඇත. විගණන නිලධාරීන්ට ආරාධනා කර නොමැත. ඉදිරියේදී නිවැරදිව සිදු කරමි. |